අධ්‍යාපන, විද්‍යා සහ තාක්ෂණ අමාත්‍යාංශය

# දිවයින පුරා පිහිටි ජාතික පාසල්වල පුරප්පාඩු වී ඇති ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ 1 ශ්‍රේණියේ විදුහල්පති තනතුරු පුරප්පාඩු පිරවීම - 2024

**2024.12.31 දින දක්වා පුරප්පාඩු ඇති වන මේ සමඟ ඇති උපලේඛනයේ සඳහන් ජාතික පාසල්වල විදුහල්පති තනතුරුවල පුරප්පාඩු පිරවීම සඳහා සුදුසු නිලධාරීන් තෝරා ගැනීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුවේ නියමය හා මැතිවරණ කොමිෂන් සභාවේ අතිරේක මැතිවරණ කොමසාරිස්ගේ අංක EDR/PARE/2024/217 හා 2024.10.07 දිනැති ලිපිය පරිදි ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ 1 ශ්‍රේණියේ සුදුසුකම්ලත් නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.**

**01. සුදුසුකම්**

i. ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ 1 ශ්‍රේණියේ නිලධාරියෙකු වීම.
**සටහන 1** : අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට පෙර ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ I ශ්‍රේණියට උසස්වීම් ලැබීමට සුදුසුකම් ලබා ඇති නිලධාරීන්ට ද මෙම පුරප්පාඩු සඳහා ඉල්ලුම් කළ හැකි අතර, නියමිත උසස්වීම් ලැබීම සඳහා සුදුසුකම් සපුරා නොමැති නිලධාරීන් විසින් ඉදිරිපත් කරනු ලබන අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. (කෙසේ වෙතත් සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේදී 1 ශ්‍රේණියට උසස්වීම් ලද ලිපිය අනිවාර්යයෙන්ම ඉදිරිපත් කළ යුතුය.)

ii. රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ අධ්‍යාපන සේවා කමිටුව හෝ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ පළාත් ප්‍රධාන ලේකම් විසින්, ජාතික පාසල් විදුහල්පතිවරු ලෙස පත් කිරීමට නුසුදුසු බවට දන්වා ඇති නිලධාරීන්ට අයදුම් කළ නොහැකිය.

iii. අයදුම්කරුවන් අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 58ට නොවැඩි විය යුතුය.
(දැනටමත් යම් ජාතික පාසලක විදුහල්පති තනතුරේ වැඩ බැලීමට / රාජකාරි ඉටුකිරීමට / රාජකාරි ආවරණය කිරීමට විධිමත්ව පත්කර ඇති නිලධාරීන්ට එම විදුහල්පති තනතුරට ම ඉල්ලුම් කිරීම සඳහා මෙම වයස් සීමාව අදාළ නොවේ.)

**02. කොන්දේසි**

**i. මෙවර පුරප්පාඩු පිරවීමේ දී අදාළ විදුහල්පති තනතුරු සඳහා පත්වීම් ලබන නිලධාරීන් එම තනතුරේ අවම වශයෙන් වසර 3 ක් වත් සේවය කළ යුතු ය.**

**ii. විදුහල්පති තනතුරට පත්වීම් ලදහොත් පිළිගත හැකි සාධාරණ හේතු නොමැතිව එම තනතුරේ රාජකාරි භාර ගැනීම ප්‍රතික්ෂේප කළ නොහැක.**

**03. අයදුම්පත් යොමු කළ යුතු ආකාරය**

i. අයදුම්කරුවන් විසින් මේ සමඟ දක්වා ඇති ආදර්ශ ආකෘතියට අනුකූලව A4 ප්‍රමාණයේ කඩදාසිවල පිළියෙළ කරන ලද අයදුම්පත නිසි පරිදි සම්පූර්ණ කර, ලියාපදිංචි තැපෑලෙන් පමණක් පහත දැක්වෙන ලිපිනයට 2024.10.30 දිනට හෝ ඊට පෙර ලැබෙන සේ එවිය යුතුය. ඉල්ලුම්පත්‍රය බහා එවන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි **"ජාතික පාසල් විදුහල්පති තනතුර - ශ්‍රී ලං.විදු.සේ. – I "** යන්න සඳහන් කොට තිබිය යුතුය. ප්‍රමාද වී ලබෙන අයදුම්පත් හා අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලබන අතර අයදුම්පත් **"සහකාර ලේකම්, අධ්‍යාපන සේවා ආයතන ශාඛාව, අධ්‍යාපන, විද්‍යා සහ තාක්ෂණ අමාත්‍යාංශය, ඉසුරුපාය, බත්තරමුල්ල"** යන ලිපිනයට යොමු කළ යුතුය.

ii. ඔබගේ මෑතකදී ලබා ගන්නා ලද අඟල් 2x2 ½ වර්ණ ඡායාරූපයක් අයදුම්පතේ දකුණු පස ඉහළ කෙළවරෙහි අලවා එවිය යුතු වේ.

iii. තවද ලකුණු පටිපාටියේ 2.1, 2.2 යටතේ දක්වා ඇති පාසල් කළමනාකරණය පිළිබඳ සේවා පළපුරුද්ද සනාථ කිරීම සඳහා පත්කිරීම් / ස්ථාන මාරු ලිපි ඉදිරිපත් කරන්නේ නම් එම ලිපි සමඟ අයදුම්කරු පාසල් වර්ගීකරණය (1AB,1C,2,3) අනුව එම වර්ගීකරණයට අයත් පාසලක අදාල කාලසීමාව තුළ සේවය කල බවට හා අදාල පත්කිරීම් / ස්ථාන මාරු කිරීම් ලිපි අත්සන් කර ඇත්තේ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ / පළාත් සභාවල ගරු ආණ්ඩුකාරවරුන්ගේ බලතල පැවරීම් අනුව නියමිත පත්වීම් බලධාරියා විසින්ම බවට අතිරේක ලේකම් (අධ්‍යාපන සේවා) / පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් ලිඛිතව සනාථ කිරීමේ ලිපියක් අයදුම්පත සමඟ හෝ සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේදී අනිවාර්යයෙන්ම ඉදිරිපත් කළ යුතුවේ.

iv. ලකුණු පටිපාටියේ දක්වා ඇති නිර්ණායකවලට අදාල ඉදිරිපත් කෙරෙන සියලු සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ අවසාන දින හෝ ඊට ප්‍රථම සම්පූර්ණ කර තිබිය යුතු අතර එදිනට පසුව සපුරා ඇති සුදුසුකම් හෝ සහතික වෙනුවෙන් ලකුණු ලබා දෙනු නොලැබේ. තවද සම්මුඛ පරීක්ෂණ දිනයෙන් පසුව ඉදිරිපත් කරන කිසිදු ලිපියක් හෝ සේවා සහතිකයක් භාරගනු නොලැබේ.

**04. ක්‍රමවේදය**

i. පාසල් පදනම් කරගනිමින් විදුහල්පතිවරු ලෙස නිලධාරීන් තෝරා නොගන්නා අතර, පුරප්පාඩු පවතින පාසල් සංඛ්‍යාවට සමාන නිලධාරීන් සංඛ්‍යාවක් විදුහල්පතිවරු ලෙස පත් කිරීම සඳහා තෝරා ගනු ලැබේ. කෙසේ වෙතත් අයදුම්පත් යොමු කිරීමේ දී අයදුම්කරුවන්ට තම මනාපය පරිදි පාසල් නම් කළ හැකි අතර, විදුහල්පති තනතුරට පත් කිරීමේ දී එම මනාපය ද සලකා බලනු ලැබේ.

**සටහන 2**: සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාවය අනුව කිසියම් පාසලක් හිමි නොවූ නිලධාරීන්, පුරප්පාඩු ලේඛනයේ සඳහන් විදුහල්පතිවරයෙකු තේරී පත් නොවූ වෙනත් පාසල් සඳහා ද පත් කිරීමට සළකා බලනු ලැබේ

ii. ඒ අනුව, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුව විසින් අනුමත කරන ලද මේ සමඟ දක්වා ඇති ලකුණු පටිපාටියට අනුව, එම කමිටුව විසින් පත් කරන ලද සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් ලබා දෙනු ලබන ලකුණු, අයදුම්කරුගේ මනාපය, සේවා අවශ්‍යතාවය, අයදුම්කරු සම්බන්ධයෙන් පැවති/පවතින විනය කටයුතු, පාසලේ සංස්කෘතික පසුබිම/සම්ප්‍රදායන්, ඉගෙනුම් මාධ්‍ය, පාසල් කාණ්ඩය (බාලක/බාලිකා/මිශ්‍ර) සහ සලකා බැලිය යුතු වෙනත් කරුණු ද සැලකිල්ලට ගනිමින් අධ්‍යාපන, විද්‍යා සහ තාක්ෂණ අමාත්‍යාංශ ලේකම් විසින් ලබාදෙන නිර්දේශයන් ද මත පදනම්ව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුව විසින් විදුහල්පති තනතුරු සඳහා පත්කරනු ලැබේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුවේ නියමය පරිදි,

**ජේ.එම්. තිලකා ජයසුන්දර**
**ලේකම්**
**අධ්‍යාපන, විද්‍යා සහ තාක්ෂණ අමාත්‍යාංශය**
2024.10. 10